වගා ආධාර චක්‍රලේඛ අංක: 08

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1989.01.04 දින.

(12)

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

## තේ නැවත වගා සහනාධාර ක්‍රමය
## වාරික සංශෝධනය

1989 ජනවාරි මස 01 වෙනි දින සිට තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ සහනාධාර මුදල් උස්බිම්/මැදබිම් දිස්ත්‍රික්ක සඳහා රු. 48,000/= ක්ද, පහත් බිම් දිස්ත්‍රික්ක සඳහා රු. 41,000/= ක්ද වශයෙන් පහත II වෙනි තීරුවේ දැක්වෙන පරිදි වාරික 05 කින් ගෙවනු ලබන පරිදි වැඩි කර ඇත.

අදාළ සංශෝධන පහත දැක්වේ.

| ආධාර කොටස | I 1988.12.31 දින තෙක් වාරික මුදල | | II වැඩිකිරීමෙන් පසු වාරික මුදල | |
|---|---|---|---|---|
| | (අ) දිස්ත්‍රික්ක | (ආ) දිස්ත්‍රික්ක | (අ) දිස්ත්‍රික්ක | (ආ) දිස්ත්‍රික්ක |
| 1. උඳුරා දැමීම | 3500 | 2500 | 3500 | 2500 |
| 2. පස සංරක්ෂණය කිරීම | 8000 | 6000 | 8000 | 6000 |
| 3. පස සාරවත් කිරීම | 4500 | 4500 | 6000 | 4500 |
| 4. වගා කිරීම | 12000 | 12000 | 21500 | 21000 |
| 5. පළමු වසර තුළ නඩත්තු කිරීම | 5000 | 5000 | 9000 | 7000 |
| 6. දෙවන වසර තුළ නඩත්තු කිරීම | 5000 | 6000 | - | - |
| 7. තෙවන වසර තුළ නඩත්තු කිරීම | 5000 | - | - | - |
| එකතුව | 43000 | 36000 | 48000 | 41000 |

(අ) දිස්ත්‍රික්ක : මහනුවර, බදුල්ල, නුවරඑළිය, සහ මාතලේ පරිපාලන දිස්ත්‍රික්ක.

(ආ) දිස්ත්‍රික්ක : ගාල්ල, මාතර, කළුතර, හම්බන්තොට, කෑගල්ල කොළඹ, රත්නපුර, කුරුණෑගල සහ මොණරාගල දිස්ත්‍රික්ක.

..... 2 පිටුව

02. 1989 ජනවාරි මස 01 වෙනි දින හෝ ඊට පසුව පවත්වන සෞත්‍ර පරීක්ෂණ අනුව ගෙවීම නිර්දේශ කරන පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් වැඩි කරන ලද ආධාර මුදල් ගෙවිය යුතුය. ඒ අනුව,

(අ) එකී දින හෝ ඊට පසුව තේ වගා කිරීමේ වාරිකය දක්වා පවත්වන පරීක්ෂණ වෙනුවෙන් වැඩි කරන ලද ආධාර මුදල් ගෙවිය යුතුය.

(ආ) එකී දින හෝ ඉන් පසුව පළමු වසර නඩත්තු කිරීමේ පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී එය අවසාන ගෙවීම් පරීක්ෂණයක් ලෙස සලකා ඊට පෙර පැවති සහනාධාර ක්‍රමය අනුව ගෙවීමට ඇති සියලුම නඩත්තු කිරීමේ වාරික එක්වර ගෙවිය යුතුය.

(ඇ) පැරණි ආධාර ක්‍රමය අනුව පළමු වසර නඩත්තු කිරීමේ වාරිකය සඳහා එකී දිනට පෙර පරීක්ෂණ පවත්වා ඇති හෝ ගෙවා අවසන් කර ඇති අවසර පත්‍රවලට ඉහත දිනයට පෙර පැවති ආධාර ක්‍රමය අනුව ඉදිරි නඩත්තු කිරීමේ වාරික වෙනුවෙන් ගෙවිය යුතු මුදල පරීක්ෂණයකින් තොරව මාසයක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුය.

03. සංශෝධිත ආධාර මුදල පිළිබඳව පහත සඳහන් පරිදි අදාළ අවසර පත්‍ර හිමියන් [illegible] දැනුම් දී ඒ බව මා වෙත වාර්තා කළ යුතුය.

(අ) දැනට නිකුත් කර ඇති තේ වගා කිරීමේ වාරිකය දක්වා (එම වාරිකයද ඇතුළුව) ගෙවීම් කිරීමට ඇති අවසර පත්‍ර සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති අංක 1 උපලේඛනය පරිදි සහනාධාර සංශෝධනය පිළිබඳව එකී අවසර පත්‍ර හිමියන්ට දැනුම් දිය යුතුය.

(ආ) පෙර පැවති ක්‍රමයට අනුව පළමු වසර නඩත්තු කිරීමේ වාරිකයේ සිට ඉදිරියට ගෙවීම් කිරීමට ඇති අවසර පත්‍ර වෙනුවෙන් අංක 2 උපලේඛනයේ පරිදි නඩත්තු කිරීමේ වාරික ඒකාබද්ධ කොට ගෙවීම් කරන බව එකී අවසර පත්‍ර හිමියන්ට දැනුම් දිය යුතුය.

(ඇ) වහාම ක්‍රියාත්මක වන පරිදි මින් ඉදිරියට නිකුත් කරන අවසර පත්‍ර සඳහා අංක 3 උපලේඛනයේ සඳහන් පරිදි සංශෝධිත ආ.ර.ප.6 ඒ, බී අවසර පත්‍ර ආවරණ ලිපිය අවසර පත්‍ර හිමියන් වෙත යැවිය යුතුය.

( ...... 3 පිටුව

04. අවසාන වරට තේ නැවත වගා සහනාධාර මුදල් වැඩි කිරීම පිළිබඳව වූ 1984.05.30 දිනැති අංක 66 දරණ චක්‍රලේඛ ලිපියේ මීට අදාළ කරුණු සම්බන්ධයෙන් දී ඇති උපදෙස් මෙම චක්‍රලේඛය අනුව නැවත සංශෝධනය කරන ලද බව සැලකිය යුතුය.

වී.කේ. නානායක්කාර
සභාපති.

පිටපත්:
1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී.
3. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්).
4. අභ්‍යන්තර විගණක.
5. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී.
6. සියලුම කම්හල් අධිකාරීන්.
7. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

ජ/01/03